# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1785/32 – 2012 නොවැම්බර් 23 වැනි සිකුරාදා – 2012.11.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: ඉ/02/34/8/41.

රක්ෂිතයක් ලෙස පවත්වා ගෙන යෑම සඳහා අවශ්‍ය වළංකන්දෙ මූකලාන නමැති ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර :

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කලවාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුකුළු කෝරලය, උඩ පත්තුවේ රඹුක ග්‍රාම නිලධාරි වසමේ රඹුක ගමේ අ.ග.සි. 943හි අතිරේක අංක 10 හා පත්‍ර අංක 10හි කැබලි අංක 1077 හා 1078 (ඉඩම් කැබලි 02ක්) දක්වා ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 2.8806 ක් පමණ වූ, වළංකන්දෙ මූකලාන නමැති ඉඩම.

1. කැබලි අංක 1077
ඉඩමේ නම: වළංකන්දෙ මූකලාන; හිමිකම් කියන අය: එම්. සාවුල් හමීඩ්, අංක 226, පන්සල පාර, රක්වාන; ප්‍රමාණය: හෙක් 2.3474.

2. කැබලි අංක 1078
ඉඩමේ නම: වළංකන්දෙ මූකලාන; හිමිකම් කියන අය: එම්. සාවුල් හමීඩ්, අංක 226, පන්සල පාර, රක්වාන; ප්‍රමාණය: හෙක් 0.5332.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන්ගේ හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2013 ජනවාරි මස 24 වැනි දින පෙ.ව. 10.00 ට කලවාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තවද, 2013 ජනවාරි 17 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම් ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ජී. ඩී. එල්. උදය කුමාරි,
ප්‍රාදේශීය ලේකම්,
කලවාන.

2012 නොවැම්බර් මස 05 වැනි දින,
කලවාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

12 - 187

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: 3/3/4/28.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: 3/ජේ/92/එෆ්ආර්/94.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඔය පළාත කෝරලේ දැලිවල දකුණ වසමේ දැලිවල ගමේ

පිහිටි අවසාන ගම් පිඹුර 639 පිඹුරේ අතිරේකය අංක 1 හා පත්‍ර අංක 2හි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.4375ක් වන කැබලි අංක 2න් පෙන්වා දී ඇති ඉඩම.

01. **කැබලි අංක 02**

ඉඩමේ නම: හපුගොල්ලේ හේන; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක් සහ අවු. 10ක් වයසැති බුරුත ගස් 02ක්, කොලොංගස් 2ක්, ගම්මාළු ගස් 1ක්, හුලංහික් ගස් 1ක්, අවු. 40ක් වයසැති කොස්ගස් 05ක්, පොල්ගස් 2ක්, අවු. 5ක් වයසැති අඹගස් 3ක්, කහට ගස් 1ක්, කජුගස් 1ක්, දොඩම් ගස් 2ක් ඇත; හිමිකම් කියන අය: යාපා මුදියන්සේලාගේ ඩිංගිරි බංඩා සහ එච්. එම්. කේ. ජී. පුංචිබණ්ඩා; ප්‍රමාණය: හෙක් 0.4375.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන්ගේ හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2013 ජනවාරි මස 09 වැනි දින පෙ.ව. 10.00 ට වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තවද, 2013 ජනවාරි 02 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

අයි. කේ. ජී. මුතුබණ්ඩා,
ප්‍රාදේශීය ලේකම්,
වලපනේ.

2012 නොවැම්බර් මස 08 වැනි දින,
වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

12 - 189

---

## ශුද්ධි පත්‍රිකාව

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: මැ/ආ සං/ඉ/1/1/13/11.
ඉඩම් අමා. අංකය: එල්/03/ජේ/95/එෆ්ආර්/202.

මොණරාගල දිස්ත්‍රික්කයේ මැදගම ප්‍රාදේශීය ලේකම් විසින් අංක 1443/3 හා 2006.05.08 දිනැති *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 7 වැනි වගන්තිය යටතේ ගැසට් පත්‍රයට අනුව ඉඩම් විස්තරය පහත පරිදි නිවැරදි විය යුතු බව මෙයින් මහජනයා වෙත දැනුම් දෙමි.

01. **කැබලි අංක 01**

ඉඩමේ නම: මහවෙල වත්ත; හිමිකම් කියන අය:ඕමාර් ලෙබ්බේ හජ්ජි මොහොමඩ්; ප්‍රමාණය: හෙක්. 0.3853.

02. **කැබලි අංක 02**

ඉඩමේ නම: මහවෙල වත්ත; හිමිකම් කියන අය:ඕමාර් ලෙබ්බේ හජ්ජි මොහොමඩ්; ප්‍රමාණය: හෙක්. 0.6473.

03. **කැබලි අංක 03**

ඉඩමේ නම: මහවෙල වත්ත; හිමිකම් කියන අය: මොහොමඩ් යාසිම් රසාක්; ප්‍රමාණය: හෙක්. 2.8894.

04. **කැබලි අංක 04**

ඉඩමේ නම: මහවෙල වත්ත; හිමිකම් කියන අය: මොහොමඩ් යාසිම් රසාක්; ප්‍රමාණය: හෙක්. 0.6733.

05. **කැබලි අංක 09**

ඉඩමේ නම: මහවෙල වත්ත; හිමිකම් කියන අය: මොහමදු අමීර් මොහමදු නිසාර්දීන්; ප්‍රමාණය: හෙක්. 4.3519.

06. **කැබලි අංක 10**

ඉඩමේ නම: මහවෙල වත්ත; හිමිකම් කියන අය: සොයාගත නොහැක (මාර්ගය); ප්‍රමාණය: හෙක්. 0.0650.

07. **කැබලි අංක 11**

ඉඩමේ නම: මහවෙල වත්ත; හිමිකම් කියන අය: සොයාගත නොහැක (මාර්ගය); ප්‍රමාණය: හෙක්. 0.1000.

08. **කැබලි අංක 12**

ඉඩමේ නම: මහවෙල වත්ත; හිමිකම් කියන අය: අහමදු ලෙබ්බේ ඕමාර් ලෙබ්බේ; ප්‍රමාණය: හෙක්. 2.5008.

09. **කැබලි අංක 13**

ඉඩමේ නම: මහවෙල වත්ත; හිමිකම් කියන අය: ආදම් ලෙබ්බේ මරික්කාර් මොහමදු හාසිම්; ප්‍රමාණය: හෙක්. 3.2015.

10. **කැබලි අංක 14**

ඉඩමේ නම: මහවෙල වත්ත; හිමිකම් කියන අය: සොයාගත නොහැක (මාර්ගය); ප්‍රමාණය: හෙක්. 0.0990.

11. **කැබලි අංක 15**

ඉඩමේ නම: මහවෙල වත්ත; හිමිකම් කියන අය: පියදාස වීරකෝන්; ප්‍රමාණය: හෙක්. 0.7993.

12. **කැබලි අංක 16**

ඉඩමේ නම: මහවෙල වත්ත; හිමිකම් කියන අය: සොයාගත නොහැක (මාර්ගය); ප්‍රමාණය: හෙක්. 0.0100.

එච්. ඩබ්. ඒ. කේ. නිශාන්ත,
ප්‍රාදේශීය ලේකම්,
මැදගම.

2012 නොවැම්බර් මස 07 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
මැදගම

12 - 188

---

## ශුද්ධි පත්‍රිකාව

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: ව/18/56/2001/අයි.

වර්ෂ 2010 ක්වූ මාර්තු මස 16 වැනි දින අංක 1645/12 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද දැන්වීමේ සඳහන් මූලික පිඹුරු අංකය ගම් 3714 දරන පිඹුරේ කැබලි අංක 18 කැබලි අංක 27 සහ 28 වශයෙන් සංශෝධනය විය යුතු බව මෙයින් දැනුම් දී සිටිමු.

**කැබලි අංක 27**

ඉඩමේ නම: මිල්ලගහවත්ත; විස්තරය: ගෙවත්ත, මිශ්‍ර වගාවක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: තිලක් රෝහණ විතාරණ සහ එස්. ඒ. මැණික්හාමි, අංක 303/1, කුරුකුලාව, රාගම; ප්‍රමාණය: හෙක්. 0.0043.

**කැබලි අංක 28**

ඉඩමේ නම: මිල්ලගහවත්ත; විස්තරය: ගෙවත්ත, මිශ්‍ර වගාවක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ඒ. චාමර සඳරුවන් සිල්වා, අංක 303/1, කුරුකුලාව, රාගම; ප්‍රමාණය: හෙක්. 0.0023.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2012 දෙසැම්බර් මස 19 වැනි දින පෙ.ව. 10.00 ට වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තවද 2012 දෙසැම්බර් 19 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

චන්දිමා දිසානායක,
ප්‍රාදේශීය ලේකම්,
වත්තල.

2012 නොවැම්බර් මස 09 වැනි දින,
වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

12 - 190